# 4 සුළු දිවැසිවරු




4.1 රූපය - සුළු දිවැසිවරු

මෙම පින්තූරයෙහි ඔබ දකින්නේ සුළු දිවැසිවරුන් කිහිප දෙනෙකි. දෙවියන් වහන්සේගේ පණිවුඩය ජනතාව වෙත ගෙන යාම, ඔවුන්ගේ වගකීම විය. ඒ අනුව සමාජය තුළ පවතින අසාධාරණය, දූෂිත පාලනය, සදාචාරයට පටහැනි ක්‍රියා, ජනතාවගේ පාපිෂ්ඨ දිවි පෙවත නිසා සිදු වන්නට නියමිත විනාශය, සැබෑ මනස්තාපයක අවශ්‍යතාව, ගිවිසුම තුළ දෙවියන් වහන්සේ හා ඒකාබද්ධ වීමේ අවශ්‍යතාව, ධර්මිෂ්ඨ ජීවිතයක වැදගත්කම යනාදිය ඔව්හු ජනතාවට පෙන්වා දුන්හ. මේ දිවැසිවරු ඉතිහාසයේ විවිධ වකවානු තුළ

වැරදි මග යමින් සිටි ඉශ්‍රායෙල් ජනතාවට දෙවි සමිඳාණන් වහන්සේ වෙත හැරෙමින් හරි මග යාමට මග පෙන්වූහ.

## ආමොස් දිවැසිවරයා



4.2 රූපය - ආමෝස් දිවැසිවරයා

මෙතුමා ක්‍රි.පූ. 8 වන සියවසේ ඉශ්‍රායෙලයේ ජීවත් වූ දිවැසිවරයෙකි. එතුමන්ගේ ගම වූයේ ජුදෙයාවේ තෙකෝවා ය. එතුමා එඬේරෙක් මෙන් ම අත්තික්කා වගා කළ ගොවියෙක් විය. ආමෝස් දිවැසිවරයා ජීවත් වූ කාලවකවානුවේ දී ඉශ්‍රායෙල් දේශය අයුක්තිය, අසාධාරණය හා වංකකමින් පිරී තිබිණි. ජනතාව පීඩාවට පත්කරමින් තලාපෙළා අසාධාරණ ලෙස මුදල් හම්බ කළහ. මෙවන් කාලවකවානුවක දිවැසිවර කැඳවීම ලත් ආමෝස් සර්ව සාධාරණ යුක්තිසහගත දෙවියන් වහන්සේ අසාධාරණ ක්‍රියා පිළිකුල් කරනා බව නොබිය ව ප්‍රකාශ කළේ ය. එබැවින් "සමාජ සාධාරණත්වයේ" දිවැසිවරයා ලෙස ආමෝස් දිවැසිවරයාව හැඳින්වේ. අප ද සාධාරණ දිවිපෙවතක් ගත කරමින් සමාජ අසාධාරණය ඉදිරියේ නැගී සිටීමට ආමෝස් දිවැසිවරයා මෙන් ක්‍රියා කළ යුතු වෙමු.

## හොසියා දිවැසිවරයා



4.3 රූපය - හොසියා දිවැසිවරයා

හොසියා ක්‍රි.පූ. 8 වන සියවසේ ජීවත් වූ තවත් දිවැසිවරයෙකි. එතුමාණන් සිය දිවැසිවර කාර්යය ඉටු කළේ ඉශ්‍රායෙලයේ ය. හොසියා දිවැසිවරයාගේ විවාහ ජීවිතය ම එක්තරා ආකාරයක දිවැසිවර පණිවිඩයක් විය. එතුමාණන් විවාහ වූයේ ගෝමෙර් නමැති කාන්තාව සමග ය. ඇය වෙනත් ස්වාමි පුරුෂයන් පසු පස ගියා ය. අවසානයේ දී ගෝමෙර් ව මනස්තාපනයට කැඳවන හොසියා

දිවැසිවරයා ඇයට සමාව දුන්නේ ය. හොසියා දිවැසිවරයාට ගෝමෙර් පිටුපෑවා සේ ඉශ්‍රායෙල් ජනතාව ද තමන්ට ඉමහත් සේ ප්‍රේම කළ දෙවියන් වහන්සේට පිටුපා වෙනත් දෙවි දේවතාවන් පසුපස ගියෝ ය. ඔවුනට වන්දනා කළෝ ය. මෙහි දී හොසියා දිවැසිවරයා තම බිරිඳ මනස්තාපනයට කැඳවූවා සේ දෙවිය න් වහන්සේට පිටුපා යමින් පාප අන්ධකාරයේ ජීවත් වූ ඉශ්‍රායෙල් ජනතාව ද මනස්තාපනයකට කැඳවී ය. ඔවුනට නැවතත් දෙවියන් වහන්සේ සොයා යන්නට, උන්වහන්සේට ගෞරව ආදරය පුදකිරීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබා දුන්නේ ය. හොසියා දිවැසිවරයා පෙන්වා දුන් ලෙස කිතුනු අප ද එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා හා ආදරය දක්වමින් ඔවුන් වහන්සේට සේවය කළ යුතු වෙමු.

### ජෝනා දිවැසිවරයා


4.4 රූපය - ජෝනා දිවැසිවරයා

ජෝනා දිවැසිවරයා ක්‍රි.පූ. 5 වන සියවසේ ජීවත් වූ දිවැසිවරයෙක් ලෙස පිළිගැනේ . ඉශ්‍රායෙල්හි විරුද්ධවාදීන් ජීවත් වූ නිනිවයට ගොස් එහි වැසියන් මනස්තාපනයට කැඳවීම ජෝනා දිවැසිවරයා ලත් කැඳවීම ය. දෙවියන් වහන්සේගේ කැඳවීම ප්‍රතික්ෂේප කළ ජෝනා දිවැසිවරයා තාර්ෂෂ් නුවර කරා යන්නට නැව් නැග්ගේ ය. එතුමන් සිටි නැව කුණාටුවකට හසුවිය. එසේ වූයේ කවුරුන් නිසාද'යි බැලීමට නැවේ සිටි නිලධාරීහු දාදු දැමූහ. එහි දී දාදුව ජෝනා වෙත වැටුණි. එතුමන් ද තමන් දෙවියන් වහන්සේගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර මෙසේ ගමන් ගන්නා බව ඔවුනට පැවසුවේ ය. කුණාටුව තමන් නිසා වන බැවින් තමන් ව මුහුදට දමන ලෙස ද ඉල්ලී ය. ජෝනා දිවැසිවරයාගේ බලවත් ඉල්ලීම මත අකමැත්තෙන් වුව ද නැවේ සිටි පිරිස විසින් ජෝනා ව මුහුදට හෙළන ලදි. එවිට කුණාටුව සමනය විය. ජෝනා දිවැසිවරයා ව මත්ස්‍යයකු විසින් ගිල තෙදිනකට පසු වමාරනු ලැබී ය. එහි දී තමන් නිනිවයට පැමිණ ඇති බව තේරුම් ගත් අතර නිනිවේ වැසියන්ට මනස්තාපනය වන ලෙස දේශනා කළේ ය. නිනිවයේ ජනතාව තමන්ගේ පාපවලට මනස්තාප වෙමින් නිරාහාරශීලි ව යාච්ඤා කළෝ ය. අවසානයේ දී ඔව්හු ජෝනා දිවැසිවරයාගේ මඟ පෙන්වීම මත දෙවියන් වහන්සේගේ කරුණාවට පාත්‍ර වූහ. අයහපත තුළ ජීවත් වෙමින් දිවි ගෙවන අය නිවැරදි මඟට ගැනීමට ජෝනා දිවැසිවරයා මෙන් අප ද ක්‍රියා කළ යුතු වෙමු.

## ක්‍රියාකාරකම

1. ගැළපෙන දිවැසිවරයාගේ නම ලියා පහත ප්‍රකාශ සම්පූර්ණ කරන්න.

- තම විවාහ ජීවිතය ම දිවැසිවර කාර්යයක් කරගත්තේ .................. .......................................................................... ය.
- මනස්තාපය තුළින් දෙවියන් වහන්සේගේ කරුණාවට ජනතාව යොමු කළේ ........................................................ ය.
- "සමාජ සාධාරණත්වයේ දිවැසිවරයා" යන විරුදාවලිය ලැබුවේ ................................................................... ය.

2. පහත අවස්ථාවන්හි ඔබට කළ හැකි එක් දිවැසි කාර්යයක් ලියන්න.

| අවස්ථාව | දිවැසි කාර්ය |
|---|---|
| • පංති කාමරය තුළ අසරණ ළමයකු පීඩාවට පත්වන විට | ..................................................<br>.................................... |
| • ඔබගේ සහෝදරයා හෝ සහෝදරිය දෙවියන් වහන්සේගෙන් ඈත් ව දිවි ගෙවන විට | ..................................................<br>..................................................<br>......................................... |
| • අයහපත් ලෙස දිවි ගෙවනා මිතුරියක් හෝ මිතුරෙක් හමු වූ විට | ..................................................<br>................................................. |



**ජීවිතයට බිඳක්**

***කාලයේ සලකුණු හඳුනා ගනිමින් තම දිවැසිවර කැඳවීම ඉටු කිරීමට යොමු වෙමි.***